# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## බාහිර විභාග අංශය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2010
2011 අප්‍රේල් / මැයි

## සමාජීය විද්‍යා පීඨය

සංවර්ධන අධ්‍යයනය - **DVST - E 1025**

## ග්‍රාමීය හා ප්‍රාදේශීය සංවර්ධනය

**ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.**

**ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි.** **කාලය : පැය 03 යි.**

---

01. රටක ප්‍රාදේශීය සංවර්ධන විෂමතා කෙරෙහි පාරිසරික සාධකවල බලපෑම පැහැදිලි කර ඒ කෙරෙහි දක්වා ඇති මානව ප්‍රතිචාර දක්වන්න.

02. දියුණුවන රටවල ග්‍රාමීය - නාගරික සංක්‍රමණ කෙරෙහි ග්‍රාමීය ආර්ථිකයෙහි පසුගාමීබව හේතුවන අයුරු විමසන්න.

03. දකුණු ආසියාතික රටවල කෘෂිකාර්මික අංශයෙහි සංවර්ධනය සඳහා, එම රටවල් ගෙන ඇති පියවර පැහැදිලි කරන්න.

04. යටත් විජිත වශයෙන් පාලනය වීම හේතුවෙන් දියුණුවන රටවල් බොහොමයක ග්‍රාමීය ආර්ථිකයෙහි පැනනැගී ඇති ගැටළු පරීක්ෂා කරන්න.

05. ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය සංවර්ධනය කෙරෙහි පහත සඳහන් ආයතන **දෙකක** ක්‍රියාකාරීත්වය කෙටියෙන් පැහැදිලි කරන්න.

    අ. දක්ෂිණ සංවර්ධන අධිකාරිය
    ආ. උඩරට සංවර්ධන අධිකාරිය
    ඇ. ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය
    ඈ. සංචාරක සංවර්ධන අධිකාරිය
    ඉ. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

06. ග්‍රාමීය රැකියා සහ ආදායම් උත්පාදනයෙහි ලා කෘෂි - නොවන අංශයේ (Non – farm sector) කාර්යයන් ප්‍රවර්ධනයෙහි වැදගත්කම සාකච්ඡා කරන්න.

07. ශ්‍රී ලංකාවේ පසුගාමී ප්‍රදේශයන්හි යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ප්‍රමුඛතාව දීමේ වැදගත්කම පැහැදිලි කරන්න.

08. රටක ග්‍රාමීය සංවර්ධනය කෙරෙහි එහි ජාතික ආර්ථික ප්‍රතිපත්තීන් මගින් ඇතිවන බලපෑම් පරීක්ෂා කරන්න.

*****************************